*සැ. යු.- මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදය වෙනම මුද්‍රණය කෙරේ.*

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,661 - 2010 ජූලි මස 02 වැනි සිකුරාදා - 2010.07.02**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| පළාත් සභා විවිධ දැන්වීම් ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | 1226 |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජූලි මස 09 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජුනි මස 24 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂ්මන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.


1285 - B 079881— 7,100 (2010/07)
F1-

# තනතුරු - ඇබෑර්තු

**රජයේ ඉඩම් ආඥාපනත යටතේ ගම් පුළුල් කිරීම සඳහා බෙදා දීමට ඇති ඉඩම් වෙනුවෙන් ඉඩම් ලබා දීමට රණවිරු සේවා අධිකාරියේ ලියාපදිංචි හලාවත රණවිරු සංසදයේ සාමාජිකත්වය ලබා ඇති ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ රණවිරුවන් අතරින් සුදුස්සන් තෝරාගනු ලැබීම සඳහා වූ ඉඩම් කච්චේරි පිළිබඳ නිවේදනය**

පහත විස්තර කර ඇති ඉඩම් සඳහා ඉල්ලුම් පත්‍ර සලකා බැලීමට හා ඒවායේ ඉඩම් කොටස් සඳහා අවසරපත්‍ර ලැබීමට සුදුසු තැනැත්තන් තෝරා ගැනීමට හලාවත ප්‍රාදේශීය ලේකම් විසින් 2010.08.16 වැනි දින පෙ. ව. 9.00ට හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී රජයේ ඉඩම් ආඥාපනත යටතේ ඉඩම් කච්චේරියක් පවත්වනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. (අ) ඉඩමේ නම : ගමේවැව
   (ආ) ඉඩමේ මැනුම් විස්තරය : අනුරේඛන අංක පු/හලා/2009/244
   (ඇ) ඉඩම පිහිටි ගම : තිත්තකඩේ
   (ඈ) ග්‍රාම නිලධාරි කොට්ඨාසය හා අංකය : 564 ඒ බටහිර මුංගන්දළුව
   (ඉ) උප දිසාපති හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාසය : හලාවත
   (ඊ) දිස්ත්‍රික්කය : පුත්තලම
   (උ) අන්සතු කිරීමට ඇති ඉඩමේ ස්වභාවය : ගොඩ ඉඩම
   (ඌ) අන්සතු කරනු ලබන ඒකකය : පර්. 15 බැගින් වූ කොටස්.

2 i. හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ස්ථිර පදිංචි රණවිරු සංසදයේ සාමාජික සියලුම දෙනාට මේ සඳහා ඉල්ලුම් කළ හැක.

ii. මියගිය හෝ අතුරුදහන් වූවන් සඳහා-

(අ) විවාහක නම් කාලත්‍රයා,
(ආ) කලත්‍රයා ද මියගොස් නම් දරුවන්ට ඒ සඳහා ඉල්ලුම් කළ හැක. (කච්චේරියේ පවත්වන ලද නිලධාරීන්ගේ අභිමතය පරිදි පවුලේ එක් දරුවෙක් ඉඩම් හිමිකම සඳහා තෝරාගනු ඇත.)
(ඇ) අවිවාහක නම් මව හෝ පියා විසින් ඉල්ලුම් කළ යුතු යි.
(ඈ) එක් රණවිරු පවුලක් වෙනුවෙන් එක් අයෙකු පමණක් ඉඩම් හිමිකම ලැබීමට සුදුසු වන්නේ ය.

3. ඉහත ඉල්ලුම්කරුවන් සියලු දෙනාම තමන්ගේ අනන්‍යතාවය තහවුරු කළ යුතු අතර, ප්‍රාදේශීය ලේකම් විසින් නියම කරනු ලබන සියලු ලිපි ලේඛන ඉඩම් කච්චේරිය වෙත මුල් පිටපත් මගින් ඉදිරිපත් කළ යුතු ය.

4. සියලුම ඉල්ලුම් පත්‍ර 2010.08.02 වැනි දිනට හෝ ඊට පෙර "ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය" හලාවත, වෙත ලැබිය යුතු ය. සියලුම ඉල්ලුම් පත් නියමිත ආකෘතියේ විය යුතු ය.

5. ඉල්ලුම්කරු ඉඩම් ලැබීම සඳහා සුදුසු වන්නේ නම් 2010.08.16 වැනි දින පෙ. ව. 9.00ට හලාවත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පැවැත්වෙන ඉඩම් කච්චේරියට පැමිණෙන ලෙස හලාවත ප්‍රාදේශීය ලේකම් විසින් ඔහුට නියම කරනු ලැබේ. ඉඩම් ලැබීම සඳහා සුදුසුකම් ලැබූ සෑම තැනැත්තෙක්ම පෞද්ගලිකවම පැමිණිය යුතු ය. එසේ නැතහොත් තමන් නියෝජනය කිරීම සඳහා වෙනත් අයෙකු ලියවිල්ලක් මගින් ඉදිරිපත් කළ යුතු යි.

6. ඉල්ලුම්කරු හෝ ඔහු නියෝජනය කරන තැනැත්තා විසින් ඉල්ලුම් පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සනාථ කෙරෙන සියලුම සහතික හා ප්‍රාදේශීය ලේකම් නියම කරනු ලබන වෙනත් අදාල ලිපි ලේඛන ඉඩම් කච්චේරියේ දී ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

7. තෝරාගනු ලබන සෑම ඉල්ලුම්කරුවෙකුටම මුල් අවස්ථාවේ දී අවසර පත්‍රයක් ලැබෙන අතර එය එහි සඳහන් කොන්දේසිවලට යටත් වනු ඇත.

8. අවසරපත්‍රයක් ලැබීමට තෝරාගනු ලබන සෑම තැනැත්තෙක්ම එසේ තෝරා ගනු ලැබූ බව දන්වනු ලැබූ වහාම තමන් තෝරා ගනු ලබා ඇත්තේ කවර ඉඩමක් සඳහා ද, ඒ ඉඩම වෙනුවෙන් අක්කරයට රුපියල් 10,00,000 බැගින් නියම කරනු ලබන මුදලක් තැන්පත් කළ යුතු වේ. මෙම තැන්පතු ආපසු නොගෙවනු ලබන නමුත් තේරුන තැනැත්තා විසින් ගෙවිය යුතු ගැනුම් මුදලට එය හිලව් කරනු ලැබේ.

9. ඉහත සඳහන් ඉඩම් කච්චේරිය පිළිබඳ විස්තර පහත දැක්වෙන තැනැත්තන්ගෙන් හෝ ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති ස්ථානවල දී ලබා ගත හැකිය.

1. පළාත් ඉඩම් කොමසාරිස් (වයඹ) පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය, කුරුණෑගල,
2. ප්‍රාදේශීය ලේකම්, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, හලාවත.

..................
ඉඩම් කොමසාරිස් (වයඹ)

අයදුම්පත්‍රයේ හා දිවුරුම් ප්‍රකාශයේ ආදර්ශ ආකෘති පහතින් දක්වා ඇත.

**රජයේ ඉඩම් ආඥා පනත යටතේ ගම් පුළුල් කිරීම සඳහා බෙදා දීමට ඇති ඉඩම් වෙනුවෙන් ඉඩම් ලබා දීමට රණවිරු සේවා අධිකාරියේ ලියාපදිංචි හලාවත රණවිරු සංසදයේ සාමාජිකත්වය ලබා ඇති ත්‍රිවිධ හමුදාවේ සහ පොලිසියේ රණවිරුවන් අතරින් සුදුස්සන් තෝරා ගනු ලැබීම සඳහා වූ ඉල්ලුම් පත්‍රය**

01. සම්පූර්ණ නම :————.
    1.1 ඉල්ලුම්කරු සෘජු සාමාජිකයා ද/නැති ද, යන වග :-
    1.2 එසේ නම් ඥාතිත්වය සඳහන් කරන්න :-
    (ඥාතිත්වය තහවුරු කිරීමට අවශ්‍ය ලිපිලේඛන ඉදිරිපත් කරන්න.)

02. ජාතික හැඳුනුම්පත් අංකය :————.

03. i. ලිපිනය :————.
    ii. ඡන්ද බලය ලබාදී ඇති මැතිවරණ කොට්ඨාසය :————.

    (අ) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
    (ආ) ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

04. ගෘහ මූලික අංකය :————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය :————.

06. වයස (අයදුම්පත් භාරගන්නා අවසාන දිනයට) :
    අවු : ————, මස : ————, දින :————.

07. උපන් දිනය :
    අවුරුද්ද : ————, මාසය : ————, දිනය :————.

08. විවාහක/අවිවාහක යන වග :————.

09. රැකියාව :————.

10. රැකියාව කරන ස්ථානයේ ලිපිනය :————.

11. අයදුම්කරු කලත්‍රයා (පුරුෂ හා භාර්යාව) ඇතුළු මුළු පවුලේ වාර්ෂික ආදායම :-

| නම | අයදුම්කරුට ඇති සම්බන්ධය | රැකියාව | වාර්ෂික ආදායම (රුපියල්) |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

12. ඉල්ලුම්කරු හා යැපෙන්නන් සතු ඉඩම්වල විස්තර :

| ඉඩමේ නම | ප්‍රමාණය | අයිතියේ ස්වභාවය | හවුලේ පරවේණි ඉඩමක් නම් පවුලේ අයට හිමි කොටස් |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(නිවාස හා දේපල උපරිම පනත යටතේ දිවුරුම් ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතුය)

13. කලත්‍රයා (පුරුෂයා හෝ භාර්යාව) රජයේ/සේවයෙකු හෝ සන්නද්ධ හමුදාවක සේවය කරන්නේනම් ඔහුගේ/ඇයගේ රාජකාරි ලිපිනය සඳහන් කරන්න. :————.

14. දැනට තමා පදිංචි නිවසේ තත්වය තමාගේද/බද්දට ද/කුලියට ද/අනවසරයෙන් ද යන වග :————.

15. නිවස පිහිටි ස්ථානය :————.

16. යැපෙන දරුවන් පිළිබඳ විස්තර :

| නම | වයස | ඉගෙනුම ලබන්නේනම් පාසලේ නම | ඉගෙනුම ලබන ශ්‍රේණිය |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

17. ඔබ හෝ කලාත්‍රයා විසින් ඉඩමක් හෝ නිවසක් මිලදී ගැනීම සඳහා රජයෙන් හෝ සේවය කරන ආයතනයෙන් ණය මුදලක් ලබාගෙන ඇද්ද? ලබා ගෙන ඇත්නම් පහත සඳහන් විස්තර සපයන්න :-

(i) ලබාගත් ණය මුදල :————.
(ii) ණය ලැබූ ආයතනයේ/
දෙපාර්තමේන්තුවේ නම :————.
(iii) දැනට ගෙවීමට ඇති ශේෂය :————.

18. පවුලේ යම් සාමාජිකයෙක් මුදල් ඉතිරි කර තිබේ ද ? තිබේ. නම් පහත විස්තර සපයන්න :-

| පවුලේ සාමාජිකයාගේ නම | ඉතිරි කිරීමේ ගිණුම පවත්වාගෙන යන ආයතනය | ඉතිරිකළ මුදල |
|---|---|---|
| | | |
| | | |
| | | |

19. ඉඩම් ලාභියෙකු වශයෙන් යථා කාලයේ දී තෝරාගනු ලැබුවහොත් ඉඩමේ වටිනාකම රජය තීරණය කරනු ලබන අන්දමට ගෙවීමට එකඟවන අතර, ඉඩම් බදු ගැනීමෙන් අනතුරුව මාස 06 කාලසීමාවක් තුළ ඉඩමේ නිවසක් ඉදිකිරීම සඳහා කටයුතු කිරීමට එකඟ වෙමි. මා විසින් ඉදිරිපත් කරන තොරතුරු ගැනීමෙන් පසුව වුව ද අසත්‍ය බව හෙළිවුවහොත් මාගේ තෝරා ගැනීම ඕනෑම අවස්ථාවක අවලංගු කල හැකි බව දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

ඉහත අයදුම්කරු විසින් ඡේද අංක 1-18 දක්වා ප්‍රකාශ කර ඇති තොරතුරු මා පරීක්ෂා කල බව ද, එම තොරතුරු මා දන්නා තරමින් නිවැරදි බව ද මින් සහතික කරමි.

————,
ග්‍රාම නිලධාරි අත්සන.

නම :————.
ග්‍රාම නිලධාරි කොට්ඨාසය :————.

අනු අත්සන් කරමි.

————.
ප්‍රාදේශීය ලේකම්ගේ අත්සන.

නම :————.
ලිපිනය :————.

........................දිස්ත්‍රික්කයේ ............ ප්‍රාදේශීය උප දිසාපති කොට්ඨාසයේ ............ ග්‍රාමසේවා වසමේ ............ පදිංචි ............... වන මම පහත සඳහන් පරිදි දිවුරා ප්‍රකාශ කරමි. :

(01) මට ද, මාගේ භාර්යාවට සහ වයස අවු. 18ට අඩු මාගේ දරුවන්ට ද, සාමුහිකව ශ්‍රී ලංකාව තුළ (රජයේ ඉඩම් සහ පුද්ගලික ඉඩම් ද ඇතුළුව) අක්කර 50ට අඩුවෙන් ඉඩම් තිබෙන බව ද, සහ 1972 අංක දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතේ 18 වැනි වගන්තිය යටතේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසමට හෝ 1973 අංක 01 දරන නිවාස දේපල උපරිම පනත යටතේ හෝ ප්‍රකාශයක් කර නැති බවට ද සහතික කරමි.

(02) එසේම ඉහත කී අක්කර.... රූඩ්... පර්.... පමණ වූ එම ඉඩම පවරා ගැනීමේ දී මිලදී ගැනීමෙන් පසුව වුව ද ඉහත ඡේදයේ සඳහන් කර ඇති අක්කර 50 හෝ සීමාව නොඉක්මවන බවත් නිවාස දේපල උපරිම පනත යටතේ සීමාවන් නොඉක්මවන බවටත් වැඩි දුරටත් මෙයින් සහතික කරමි.

————,
දිවුරුම්කරු.

ඉහත සඳහන් දිවුරුම්කරුට/කාරියට මෙහි අඩංගු දෑ කියවා තේරුම් කර දුන් අතර ඔහු/ඇය මෙහි සඳහන් කරුණු හොඳින් තේරුම් ගැනීමෙන් පසුව මා ඉදිරියේ අත්සන් තැබූ බවත් සහතික කරමි.

————,
සමාදාන විනිශ්චකාර තැන.

07-22

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන

## සංශෝධිත ගාස්තු

2009 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රීම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2009 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | | | | රු. ශ. |
|---|---|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... | ... | ... | ... | 137 00 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට | ... | ... | ... | 137 00 |
| තනි තීරුවකට හෝ ගැසට් පිටුවකින් අඩකට | ... | ... | ... | 1,300 00 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ ගැසට් පිටුවකට | ... | ... | ... | 2,600 00 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ ගැසට් පත්‍රයේ සෑම කොටසක ම කෙළවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. **2009 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### * ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 2,080 00 | 3,120 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 1,300 00 | 3,120 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 780 00 | 3,120 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 4,160 00 | 6,240 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 580 00 | 3,120 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 405 00 | 3,120 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 890 00 | 2,400 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 860 00 | 420 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 260 00 | 180 00 |
| අති විශෙෂ ගැසට් පත්‍රය... ... ... ... ... ... ... ... | 5,145 00 | 5,520 00 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | පිටපතක මිළ | තැපැල් ගාස්තුව |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 00 | 60 00 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 00 | 60 00 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 00 | 60 00 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 00 | 120 00 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 00 | 60 00 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 00 | 60 00 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 00 | 60 00 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 00 | 60 00 |

* කොළඹ 05, කිරුළපන, මායා මාවතේ, අංක 132 හි ප්‍රකාශන කාර්යංශයේ තනිපිටපත් විකිණීම සහ දායක මුදල් භාර ගැනීමේ අධිකාරී වෙත මුදල් ලැබෙන්නට සළස්වන්න.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවත් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙනන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවාත් හැර එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා රජයේ මුද්‍රණාලයාධිපති දායක මුදල් භාර නොගනී. සියලු ම දායක මුදල් කොළඹ 05, කිරුළපන, මායා මාවතේ අංක 132 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

***සැළකිය යුතුයි.*** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත නොව රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | | | **2010** | | | |
| ජූලි | 2010.07.02 | සිකුරාදා | 2010.06.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.07.09 | සිකුරාදා | 2010.06.24 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2010.07.16 | සිකුරාදා | 2010.07.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.07.23 | සිකුරාදා | 2010.07.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.07.30 | සිකුරාදා | 2010.07.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| අගෝස්තු | 2010.08.06 | සිකුරාදා | 2010.07.23 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.08.13 | සිකුරාදා | 2010.07.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.08.20 | සිකුරාදා | 2010.08.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.08.27 | සිකුරාදා | 2010.08.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| සැප්තැම්බර් | 2010.09.03 | සිකුරාදා | 2010.08.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.09.09 | බ්‍රහස්පතින්දා | 2010.08.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.09.17 | සිකුරාදා | 2010.09.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2010.09.24 | සිකුරාදා | 2010.09.09 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.